සියලුම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province 4251

10 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2022(2023) | 60 S I

නම: .......................................... ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

කාලය පැය තුනයි.
අමතර කියවීම් කාලය මිනිත්තු 10යි.

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක. 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1),(2),(3),(4) යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ගන්න.
- ඔබට සපයන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.
- පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් සැලකිල්ලෙන් කියවා ඒවාද පිළිපදින්න.
- අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරාගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛතාවය දෙන ප්‍රශ්නය සංවිධානය කරගැනීමටත් යොදාගන්න.

පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් ප්‍රශ්න අංක 01 සිට 05 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

- සඳුන් අ.පො.ස. උසස් පෙළ විභාගයෙන් පසුව ඖෂධවේදී පාඨමාලාව හදාරා ඇති ඖෂධවේදියෙකි. ඔහුගේ මිතුරිය වන තමරා මහනුවර රෝහල අසල ගොඩනැගිල්ලක් හිමි අයෙකි. සඳුන් හා තමරා එකතුව '' සුව අරණ '' නමින් ඔසු හලක් ආරම්භ කල අතර වර්තමානයේ රටේ පවතින මූල්‍ය අර්බුදය හමුවේ ඇතිවූ මූල්‍ය ගැටළුව විසඳා ගැනීම සඳහා මහජන බැංකුවෙන් අඩු පොලියට ණය මුදලක් ලබාගැනිණි. තවද ව්‍යාපාරයේ සේවය සඳහා සේවකයන් දෙදෙනෙකු බඳවාගන්නා ලදි.

01) ඉහත සිද්ධියට අදාල වුවමනාව හා අවශ්‍යතාවය පිලිවෙලින් ඇති නිවැරදි පිළිතුර වනුයේ,
1. සෞඛ්‍යය - රෝගියා 2. රෝගියා - සෞඛ්‍යය 3. රෝගියා - ඖෂධ 4. ඖෂධ - සෞඛ්‍යය

02) '' සුව අරණ '' ව්‍යාපාරය අයත්වන ව්‍යාපාර සංවිධානය වන්නේ,
1. තනි පුද්ගල ව්‍යාපාර වලටය. 2. හවුල් ව්‍යාපාර වලටය.
3. සංස්ථාපිත සමාගම් වලටය. 4. සමුපකාර සංවිධානය වලටය.

03) ඉහත සිද්ධියේ තොරතුරු වලට අනුව මෙම ව්‍යාපාරයේ ඇති අවස්ථාවක් වනුයේ,
1. අඩු පොලියට බැංකු ණයක් ලබාගත හැකිවීම.
2. සඳුන් ඖෂධවේදී පාඨමාලාව හදාරා තිබීම.
3. තමරා සතුව ගොඩනැගිල්ලක් තිබීම.
4. ව්‍යාපාරයට දක්ෂ සේවකයින් දෙදෙනෙකු බඳවාගැනීම.

04) '' සුව අරණ'' ඖෂධ ව්‍යාපාරයේ බාහිර පරිසරය සඳහා නිදසුනකි.
1. තමරා 2. සේවකයින් 3. මහජන බැංකුව 4. සඳුන්

05) '' සුව අරණ '' ව්‍යාපාරයට සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරාන්න.
1. නෛතික පුද්ගලභාවයක් හිමි ව්‍යාපාරයක් වේ.
2. වගකීම සීමා සහිත වේ.
3. සමාගම් පනත යටතේ ලියාපදිංචි කළ යුතුයි.
4. අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම.

06) වී ගොවියකු වන අපොන්සු මහතා තම කුඹුරෙන් නෙලාගත් වී අස්වැන්න අයත්වන නිවැරදි නිෂ්පාදන සාධකය කුමක්ද?
1. ව්‍යවසායටය. 2. භූමියටය. 3. ප්‍රාග්ධනයටය. 4. ශ්‍රමයටය.

07) ලාභ අපේක්ෂිත ව්‍යාපාරවල පොදුවේ දැකිය හැකි ව්‍යාපාර අරමුණක් නොවන්නේ,
1. පාරිභෝගික තෘප්තිය ඉහළ නැංවීම. 2. මිලෙන් අධික භාණ්ඩ විකිණීම.
3. සේවක සුභ සාධනය ගැන සැලකිලිමත්වීම. 4. භාණ්ඩවල ගුණත්වය ඉහළ නැංවීම.

08) ව්‍යාපාරයක ඇල්මැති පාර්ශවය A තීරුවේද ඔවුන්ගේ අරමුණු B තීරුවේද දැක්වේ.

| A | B |
|---|---|
| අයිතකරු | A බදු ආදායම නිසි පරිදි ලබාගැනීම. |
| කළමනාකරුවන් | B ආයෝජනයේ සුරක්ෂිතාව |
| තරගකරුවන් | C නිෂ්පාදිත වල මිල තීරණය කිරීම. |
| රජය | D තීරණ ක්‍රියාත්මක කිරීම. |

ඇල්මැති පාර්ශවයට අදාල අරමුණ නිවැරදිව ගැළපූ විට නිවැරදි පිළිතුර තෝරන්න.

1. BDCA 2. ADBC 3. BADC 4. BCDA

09) පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් දේශපාලන පරිසරයට පමණක් අයත්වන පිළිතුර තෝරන්න.

1. යටිතල පහසුකම් සංවර්ධන ප්‍රතිපත්ති / අයවැය ප්‍රතිපත්ති
2. යටිතල පහසුකම සංවර්ධන ප්‍රතිපත්ති / උද්ධමනය
3. විදේශ විනිමය අනුපාතය / රැකියා නියුක්තිය
4. රැකියා නියුක්තිය / ආදායම් ව්‍යාප්තිය

10) කසුනි විසින් අත්බෑග් නිෂ්පාදන ව්‍යාපාරයක් පවත්වාගෙන යයි. අත්බෑග් නිෂ්පාදනය කරන ව්‍යාපාර වලට රජය බදු සහන ලබාදේ. රජය ලබාදෙන මෙම බදු සහනය ව්‍යාපාරයට

1. ශක්තියකි. 2. දුර්වලතාවයකි. 3. අවස්ථාවකි. 4. තර්ජනයකි.

11) ව්‍යාපාර සංවිධාන වර්ග කිහිපයක් පහතින් දැක්වේ.

A. හවුල්ව්‍යාපාර B. සමිති සංවිධාන
C. සංස්ථාපිත සමාගම් D. රාජ්‍ය සංස්ථා

මෙවා අතුරෙන් ලාභ අරමුණු **කරනොගත්** ව්‍යාපාර සංවිධානවලට ඇතුලත්විය යුත්තේ,

1. B හා D වේ. 2. B හා C වේ. 3. A හා B වේ. 4. C හා D වේ.

12) හවුල් ව්‍යාපාරයක හවුල්කරුවන් අතර ඇතිකරගනු ලබන එකගතාවය හවුල් ගිවිසුමකි. එය ලිඛිත ගිවිසුමක් විය යුතු බව සඳහන් පනත වන්නේ,

1. 1890 හවුල් ව්‍යාපාර ආඥා පනත
2. 2007 අංක 07 දරණ සමාගම් පනත
3. 1840 වංචා වැලැක්වීමේ ආඥා පනත
4. 1918 අංක 06 දරණ ව්‍යාපාර නාම ආඥා පනත

13) විශේෂ හෝ පොදු පාර්ලිමේන්තු පනතක් මගින් ආරම්භ කරන රාජ්‍ය සංස්ථා හැඳින්වීමට **භාවිතා නොකරන** නම වන්නේ,

1. මණ්ඩලය 2. අධිකාරිය 3. කාර්යාංශය 4. දෙපාර්තමේන්තුව

14) ඒක පුද්ගල ව්‍යාපාරයක නාමය ලියාපදිංචි කිරීම තුළින් ලබාගත හැකි ප්‍රයෝජනයකි.

1. අඛණ්ඩ පැවැත්මක් ලබාගත හැකිවීම.
2. නීතිමය පුද්ගල භාවයක් හිමිවීම.
3. ව්‍යාපාරයට අනන්‍යතාවයක් හිමිවීම.
4. අයිතිකරුවන්ගේ වගකීම් සීමිතවීම.

15) සේවක සංඛ්‍යාව 25ට අඩු ව්‍යාපාර ජන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුවට අනුව හඳුන්වනුයේ කුමන නමකින්ද?

1. සුළු පරිමාණ ව්‍යාපාර ලෙසය.
2. මහා පරිමාණ ව්‍යාපාර ලෙසය.
3. කුඩා පරිමාණ ව්‍යාපාර ලෙසය.
4. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ලෙසය.

16) තනිපුද්ගල ව්‍යාපාරයක් ආරම්භ කර ලියාපදිංචිය සඳහා අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ,

1. දින 41ක් ඇතුළත දීය.
2. දින 14ක් ඇතුළතදීය.
3. දින 10ක් ඇතුළතදීය.
4. දින 16ක් ඇතුළතදීය.

17) මූල්‍ය ගිණුම්කරණයේ ප්‍රධානම අරමුණ වනුයේ,

1. ව්‍යාපාරය ප්‍රමාණවත් ලාභයක් උපයාගෙන තිබේද යන්න දැනගැනීම.
2. ඇල්මැති පාර්ශවයන්ට තීරණගැනීමට ප්‍රයෝජනවත් තොරතුරු සැපයීම.
3. ව්‍යාපාරයක මූල්‍ය තත්ත්වය සතුටුදායක ද යන්න දැනගැනීම.
4. නීතිමය අවශ්‍යතා ඉටුකරගැනීම සඳහා

18) වගකීමක දැකිය හැකි ලක්ෂණයක් **නොවන්නේ,**

1. අතීත ගණුදෙනුවක ප්‍රතිඵලයක් වීම.
2. ව්‍යාපාරයේ පාලනයට යටත්වීම.
3. වර්තමාන බැදීමක් තිබීම.
4. බේරුම්කිරීමේදී සම්පත් වලින් කොටසක් පිටතට ගලායාම.

19) පහත දැක්වෙනුයේ ශිෂ්‍යයෙකු ගණුදෙනුවක් ගිණුම්කරණ සමීකරණයේ නිරූපනය කර ඇති ආකාරයයි.

| වත්කම | = | හිමිකම් + වගකීම |
|---|---|---|
| + 25000 | | |
| - 25000 | | |

ඉහත ගණුදෙනුව නිවැරදිව ප්‍රකාශ වන ප්‍රකාශය තෝරන්න.

1. රුපියල් 25000ක බැංකු ණයක් ලබාගැනීම.
2. රුපියල් 25000ක භාණ්ඩ ණයට ගැනීම.
3. රුපියල් 25000ක භාණ්ඩ ණයට විකිණීම.
4. රුපියල් 25000ක් අයිතිකරු ගැනිලි ලෙස මුදලින් ලබාගැනීම.

20) ව්‍යාපාරයක අයිතිකරුගේ හිමිකම වෙනස්වීමක් සටහන් කිරීමට යොදාගනු ලබන ගිණුම් තෝරන්න.

1. මුදල් ගිණුම, බැංකු ගිණුම
2. ණයගැති ගිණුම, ණයහිමි ගිණුම
3. ලදවට්ටම් ගිණුම, ගැනිලි ගිණුම
4. විදුලිය ගාස්තු ගිණුම, උපකරණ ගිණුම

21) ලක්ෂාන්ගේ ව්‍යාපාරයේ 2022 වර්ෂයේ අගෝස්තු මාසයට අදාල පහත තොරතුරු ඔබට සපයයි.

| | | |
|---|---|---|
| 2022.08.01 ප්‍රාග්ධනය | රු. | 435 000 |
| අගෝස්තු මස වියදම් | රු. | 121 500 |
| අගෝස්තු මස ආදායම් | රු. | 239 650 |
| අගෝස්තු මස අමතර ප්‍රාග්ධනයේ යෙදවීම් | රු. | 50 000 |
| අගෝස්තු මස මුදල් ගැනිලි | රු. | 5 000 |

2022.08.31 දිනට හිමිකමෙ නිවැරදි වටිනාකම

1. රු. 598 150
2. රු. 724 650
3. රු. 674 650
4. රු. 548 150

22) රු. 45000ක් පිරිවැය වූ භාණ්ඩය තොගයක් අමල්ට විකුණන ලදි. මෙය ගිණුම් ගතකිරීමට අදාල නිවැරදි ද්විත්ව සටහන තෝරන්න.

1. මුදල් ගිණුම හර රු. 45000, විකුණුම් ගිණුම බැර රු. 45000
2. අමල්ගේ ගිණුම හර රු. 45000, විකුණුම් ගිණුම බැර රු. 45000
3. විකුණුම් ගිණුම හර රු. 45000, අමල්ගේ ගිණුම බැර රු. 45000
4. මුදල් ගිණුම හර රු. 45000, අමල්ගේ ගිණුම බැර රු. 45000

23) සහන් ව්‍යාපාරයේ 2022.10.01 දිනට වත්කම්, හිමිකම හා වගකීම් පිළිවෙලින් රු.300,000, රු. 230,000 හා රු. 70,000 වේ. පසුව පහත ගණුදෙනු සිදුව ඇත.

A. අයිතිකරුගේ නිවසේ විදුලි බිල රු.10,000ක් ව්‍යාපාරයේ මුදලින් ගෙවීම.
B. පිරිවැය රු. 50,000ක භාණ්ඩ රු. 70,000කට ණයට විකිණීම.
C. රු. 20,000ක ණයක් ගෙවීම.

ඉහත ගණුදෙනු වලින් පසු නිවැරදි අගයන් සහිත නිවැරදි ගිණුම්කරණ සමීකරණය තෝරන්න.

| | වත්කම් (රු) | = | වගකීම (රු) | + | වගකීම් (රු) |
|---|---|---|---|---|---|
| 1. | රු. 270,000 | = | 50,000 | + | 220,000 |
| 2. | රු. 290, 000 | = | 50,000 | + | 240,000 |
| 3. | රු. 270, 000 | = | 220,000 | + | 50,000 |
| 4. | රු. 290, 000 | = | 240,000 | + | 50,000 |

24) රුපියල් 200,000ක් වටිනා ලීබඩු සඳහා රු. 125,000ක මුදලක් ගෙවා පසුව ඉතිරි මුදල ගෙවීමේ පොරොන්දුව පිට ලබාගන්නේ නම්, ව්‍යාපාරයේ,

1. වත්කම රු. 200,000 වැඩිවේ, හිමිකම රු. 125,000කින් අඩුවේ, වගකීම් රු.75,000කින් වැඩිවේ.
2. වත්කම රු. 200,000 වැඩිවේ, වත්කම රු. 125,000කින් අඩුවේ, වගකීම් රු. 75,000කින් වැඩිවේ.
3. වත්කම් රු. 200,000 වැඩිවේ, වගකීම රු. 200,000 වැඩිවේ.
4. වත්කම් රු. 200,000 වැඩිවේ, වත්කම රු. 125,000 අඩුවේ, හිමිකම රු. 75,000කින් අඩුවේ.

25) පහත වගුව ඇසුරෙන් පිළිතුරු සපයන්න.

| මූලික පොත් | මූලාශ්‍ර ලේඛන |
|---|---|
| A. මුදල් පොත | P ජ'නල් වවුචරය |
| B. බැංකු ගිණුම | Q ගෙවීම් වවුචරය |
| C. විකුණුම් ජ'නලය | R තැන්පත් කිරීමේ කුවිතාන්සිය |
| D. පොදු ජ'නලය | S විකුණුම් ඉන්වොයිසිය |

ඉහත වගුවේ මූලික පොතට අදාල මූලාශ්‍ර ලේඛණය නිවැරදිව ගැළපූ විට නිවැරදි පිළිතුර

1. CS, DP,AQ, BR 2. AQ,CP,DS,BR 3. AR,BQ,CP,DS 4. AQ,BR,CS,DP

26) ව්‍යාපාරයක ගිණුම් තැබීමේදී භාවිතා කරනු ලබන මූලික පොත් .............. යන නමින්ද හඳුන්වයි. හිස්තැනට අදාල නිවැරදි පිළිතුර

1. දෛනික පොත් 2. මුදල් පොත් 3. සුළු මුදල් පොත් 4. ආරම්භක පොත්

• පහත දී ඇති තොරතුරු ඇසුරෙන් 27 හා 28 යන ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
පැතුම්ට රු. 20,000ක භාණ්ඩ ණයට විකුණන ලදි. එහිදී 10%ක වෙළඳ වට්ටමක් සහ පැතුම නියමිත දින මුදල් ගෙවීම නිසා 5%ක මුදල් වට්ටමක් ව්‍යාපාරය විසින් ලබාදුනි.

27) ඒ අනුව ගණුදෙනුවට අදාල මුදල් වට්ටම හා වෙළඳ වට්ටම පිළිවෙලින් ඇති පිළිතුර වන්නේ,

1. රු. 2000ක් හා රු. 900කි. 2. රු. 900ක් හා රු. 2000කි.
3. රු. 2000ක් හා රු. 1000කි. 4. රු. 1000ක් හා රු. 2000කි.

28) අදාල මුළු ණය මුදල පියවීමේදී පැතුම් ව්‍යාපාරයට ගෙවිය යුතු වටිනාකම කොපමණද?

1. රු. 18000කි. 2. රු. 17000කි. 3. රු.17100කි. 4. රු. 19000කි.

29) චතුරගේ ව්‍යාපාරයේ 2022 ජනවාරි මාසයේ සුළු මුදල් වවුචර් පත්වල එකතුව රු. 4600කි. සුළු මුදල් භාරකරු අත ඉතිරිමුදල රු. 400ක් වේ. සුළු මුදල් අග්‍රිමය රු. 500කින් පෙබරවාරි මස සිට වැඩි කිරීමට තීරණය කලේ නම්, පෙබරවාරි 01 වන දින ප්‍රතිපූර්ණය කළ යුතු මුදල හා සුළු මුදල් අග්‍රිමය පිලිවෙලින් ඇති නිවැරදි පිලිතුර,

1. රු. 5100 හා රු. 5500 2. රු 4600 හා රු. 5000
3. රු. 5500 හා රු. 5100 4. රු. 5000 හා රු. 4600

30) ව්‍යාපාරය විසින් ණයහිමියෙකු සඳහා නිකුත් කළ රු. 45000ක චෙක්පතක් අගරු කළ බව බැංකුව විසින් අගරු නිවේදනයකින් දැනුම් දෙන ලදි. චෙක්පත අගරුකිරීම පිළිබඳව නිවැරදි ද්විත්ව සටහන ඇතුළත් පිළිතුර තෝරන්න.

1. ණයහිමි ගිණුම හර රු. 45000, බැංකු ගිණුම බැර රු. 45000
2. බැංකු ගිණුම හර රු. 45000, ණයහිමි ගිණුම බැර රු. 45000
3. ණයහිමි ගිණුම හර රු. 45000, අගරු චෙක්පත් ගිණුම රු. 45000
4. ගැනුම් ගිනුම හර රු. 45000, ණයහිමි ගිණුම බැර රු. 45000

• පහත සඳහන් තොරතුරු ඇසුරෙන් 31 හා 32 යන ප්‍රශ්ණ වලට පිළිතුරු සපයන්න.
අචලාගේ ව්‍යාපාරයේ 2022 සැප්තැම්බර් මාසයේ බැංකු ගිණුමේ වාසිදායක ශේෂය රු. 75000කි. නමුත් බැංකු විස්තරයේ දක්නට ලැබුණේ වෙනත් අගයකි. හේතු සේවීමේදී පහත හේතු ඊට බලපා ඇත.

A. ස්ථාවර නියෝග මත ගෙවා ඇති රක්ෂණ වාරිකය රු. 10000කි.
B. බැංකුව සෘජුව ලැබී ඇති ආයෝජන ආදායම රු. 7000කි.
C. තැන්පත් කළ නිශ්කාශනය නොවූ චෙක්වල වටිනාකම රු. 12000කි.
D. නිකුත් කළ නමුත් ඉදිරිපත් නොවූ චෙක් රු. 15000ක් පමණි.

31) 2022 සැප්තැම්බර් 30 දිනට සංශෝධිත සංශෝධිත බැංකු ගිණුමේ නිවැරදි ශේෂය,

1. රු. 68000කි. 2. රු. 72000කි. 3. රු. 75000කි. 4. රු. 78000කි.

32) 2022 සැප්තැම්බර් 30 දින බැංකු ප්‍රකාශනයේ නිවැරදි ශේෂය විය යුත්තේ,

1. රු. 65000කි. 2. රු. 69000කි. 3. රු. 75000කි. 4. රු. 82000කි.

33) ව්‍යාපාරයේ බැංකු ගිණුමේ අවසාන ශේෂය හා බැංකු විස්තරයේ අවසාන ශේෂය වෙනස්වීමට බලපාන කරුණක් **නොවන්නේ,**

1. බැංකු ගාස්තු 2. චෙක්පොත් ගාස්තු 3. සෘජු ප්‍රේෂණ 4. බැංකු අයිරාව

35) වර්තමානයේ මහාපරිමාණ ව්‍යාපාර මූල්‍ය වාර්තා සකස් කිරීම සඳහා ස්වයංක්‍රිය මෘදුකාංග පැකේජ භාවිතා කරයි. එලෙස භාවිතා නොවන මෘදුකාංගයක් වන්නේ,
1. ACC Pac 2. Quick Book 3. Saga 4. Linux

36) වෙළඳ භාණ්ඩ ණයට විකුණුම් සටහන් කරනු ලබන මූලික පොත හා මූලාශ්‍ර ලේඛනය පිළිවෙලින් ඇතුළත් නිවැරදි පිළිතුර තෝරන්න.
1. විකුණුම් ජනලය හා ගැනුම් ඉන්වොයිසිය.
2. විකුණුම් ජනලය හා විකුණුම් ඉන්වොයිසිය
3. විකුණුම් ඉන්වොයිසිය හා විකුණුම් ජනලය
4. මුදල් පොත හා ගෙවීම් වවුචරය

37) ව්‍යාපාරයක ශේෂ පිරික්සුමක් පිලියෙල කිරීමේ ප්‍රධාන අරමුණ වන්නේ,
1. ගණිතමය නිවැරදි තාවය තහවුරු කරගැනීමයි.
2. ද්විත්ව සටහන්වල නිවැරදිතාවය තහවුරුකරගරගැනීමයි.
3. ලෙජර් ගිණුම් නිවැරදි තුලනය කර ඇති බව තහවුරු කරගැනීමයි.
4. වත්කම්, හිමිකම්, වගකීම්, නිවැරදිව සටහන් කර ඇතිබව සොයගැනිමයි.

38) ව්‍යාපාරයක 2022.3.31 දිනට පිළියෙල කල ශේෂ පිරික්සුමේ හර තීරුවේ එකතුව රු. 700,000ක් වූ අතර, බැර තීරුවේ එකතුව රු.750 000ක් විය. මෙම වෙනසට හේතු වූ ගිණුම්කරණයේ සිදුවී ඇති වරද තෝරන්න.
1. දුන් වට්ටම් ගිනුමේ එකතුව රු. 50,000ක් වැඩියෙන් එකතු කර ඇත.
2. විකුණුම් ගිණුමේ එකතුව රුපියල් 50,000ක් වැඩියෙන් එකතු කර ඇත.
3. ගැනුම් ගිණුමේ එකතුව රු.50,000ක් වැඩියෙන් සටහන් කිරීම.
4. ලද වට්ටම් ගිණුමේ ශේෂය රු. 50,000 අඩුවෙන් ගෙන තිබීම.

39) රු. 25,000ක ගැනුම් ඉන්වොයිසියක් ගිණුම්පොත්වල දෙවරක් සටහන් වීමේ වරද නිවැරදි කිරීමට අදාල ජනල් සටහන වනුයේ,
1. ගැනුම් ගිනුම හර 25000, ණය හිමි ගිණුම බැර රු. 25000
2. අවිනිශ්චිත ගිණුම හර රු. 25000 ණයහිමි ගිණුම බැර රු. 25000
3. ණයහිමි ගිණුම හර රු. 25,000 ගැනුම් ගිණුම බැර රු. 25000
4. ණයහිමි ගිණුම හර රු 25,000 අවිනිශ්චිත ගිණුම බැර රු. 25,000

40) ව්‍යාපාරයක ගිණුම්තැබීමේදී සිදුවූ වැරදි නිවැරදි කළ පසු පියවී යන ගිණුම (අවසන් වන ගිණුම) වන්නේ,
1. මුදල් ගිණුම
2. වැරදි නිවැරදි කිරීමේ ගිණුම
3. ලාභ හෝ අලාභ ගිණුම
4. අවිනිශ්චිත ගිණුම

* * * * * * * *

සියලු හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province.

4273

| 10 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2022(2023) | 60 S II |
|---|---|---|

නම: ..................................... **ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය** 9627 කාලය පැය දෙකයි

වැදගත් :
- උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- පළමුවන ප්‍රශ්නය ඇතුළුව I කොටසින් ප්‍රශ්න දෙකක්ද II කොටසින් ප්‍රශ්න දෙකක්ද බැගින් තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
  පිළිතුරු පැහැදිලි අත් අකුරෙන් ලියන්න.

01) පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් ප්‍රශ්න අංක (I) සිට (x) තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම උපාධිධාරියෙකු වන ලහිරු රැකියාවක් අපේක්ෂාවෙන් සිටි අතර මෑතකදී රජය මගින් කෘමි නාශක ආනයනය විදේශ විනිමය ගැටලුව නිසා තහනම් කෙරිනි. මේ නිසා ගොවීන් වගා කටයුතු වලදී මහත් අසීරුතාවයන්ට පත්විය. ඔහුගේ පියාද ගොවියකු වූ අතර ඔහුගේ උපදෙස් සහ සහය ඇතිව දේශීයව බහුලව වැඩෙන කොහොඹ ශාකයේ පත්‍ර භාවිතයෙන් නව පලිබෝධ නාශකයක් අත්හදා බලන ලදි. එය සාර්ථක වූ බැවින් එය නිෂ්පාදනය කර අලෙවි කිරීමේ ව්‍යාපාරයක් 2022.06.01 දින ''කෘෂි ඔසු'' නමින් ආරම්භ කෙරිනි.

ඒ සඳහා තමා ඉතිරිකරගත් රු. 150,000ක මුදල් ව්‍යාපාරයට යොදාගත්තා ලදි. නිෂ්පාදන කටයුතු සඳහා අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර මිලදී ගැනීමට රු.25000ක් යෙදවිය. එසේම ව්‍යවසාය සංවර්ධන සහාය යටතේ අඩු පොලියට මහජන බැංකුවෙන් රුපියල් 200,000ක ණය මුදලක්ද 2022.06.01 දින ලබාගැනිනි.

2022 ජූනි මාසයේ සිදුවූ ගණුදෙනු පහතින් දැක්වේ.

| | | |
|---|---|---|
| ජූනි 03 - | ගොඩනැගිලි අලුත්වැඩියා වියදම් | රු. 75,000 |
| ජූනි 06 - | අමුද්‍රව්‍ය මිලට ගැනුම් | රු. 122,000 |
| ජූනි 10 - | අවශ්‍ය විදුරු බෝතල් ගැනීම | රු. 85,000 |
| ජූනි 15 - | අත්පිට විකුණුම් | රු. 500,000 |
| ජූනි 23 - | දුරකථන ගාස්තු | රු. 2000 |

2022 ජූලි මස 01 වන දින තම විශ්වවිද්‍යාල මිතුරෙකු වූ වෙනුජ ව්‍යාපාරය සඳහා බඳවාගනී.

i. (අ) ''කෘෂි ඔසු'' ව්‍යාපාරයේ හිමිකාරිත්වය අනුව අයත්වන ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක්ද?
(ආ) අරමුණ අනුව වර්ග කරන්නේ නම් අයත්වනුයේ කුමන ව්‍යාපාර සංවිධාන වර්ගයටද?
ii. ''කෘෂි ඔසු'' ව්‍යාපාර ලියාපදිංචි කළ යුතු බව වෙනුජ පවසයි.
(අ) මෙම ප්‍රකාශනය සමග ඔබ එකග වන්නේද?
(ආ) ඉහත (අ) හි ඔබ සැපයූ පිළිතුරට හේතුව සඳහන් කරන්න.
iii. (අ) මෙම ව්‍යාපාරයේ ශක්තියක් සඳහන් කරන්න.
(ආ) ඉහත ව්‍යාපාරය සතු අවස්ථාවක් ලියන්න.
iv. (අ) මෙම ව්‍යාපාරයේ ඇල්මැති පාර්ශවයන් දෙකක් නම් කරන්න.
(ආ) මෙම සිද්ධිය තුළ ඔබ දකින බාහිර පරිසර සාධක දෙකක් ඉදිරිපත් කරන්න.
v. (අ) වෙනුජ බඳවා ගත් පසු අයිතිය අනුව මෙම ව්‍යාපාරය අයිතිය අනුව හඳුන්වනුයේ කුමන නමකින්ද?
(ආ) එම ව්‍යාපාර සංවිධාන වර්ගයේ වාසි දෙකක් පෙන්වන්න.
vi. 2022.06.01 දිනට ව්‍යාපායේ ගිණුම්කරණ සමීකරණය වටිනාකම සහිතව ලියන්න.
vii. මෙම ව්‍යාපාරයේ ජංගම නොවන වගකීමක් හා ජංගම නොවන වත්කමක් වටිනාකම සහිතව පෙන්වන්න.
viii. ජූනි 15 දිනට අත්පිට විකුණුම් වලට අදාල ද්විත්ව සටහන වටිනාකම් සහිතව ඉදිරිපත් කරන්න.
ix. ජූනි 15 ගණුදෙනුවට අදාලව භාවිතා කරන මූලාශ්‍ර ලේඛණය හා මූලික පොත පිළිවෙලින් නම් කරන්න.
x. ජූනි 30 දිනට ව්‍යාපාරයේ මුදල් ශේෂය කොපමණද?

I කොටස (ව්‍යාපාර අධ්‍යයනය)

• ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.

02) i. (අ) මිනිස් අවශ්‍යතා යනු කුමක්ද?
(ආ) අවශ්‍යතා හා උවමනා අතර ඔබ දකින වෙනස්කම් දෙකක් ලියන්න. (ල.02)

ii. පහත සඳහන් ප්‍රකාශ සත්‍යද අසත්‍යද යන්න දක්වන්න.
(අ) භාණ්ඩ වලට භාණ්ඩ හුවමාරු කිරීමේ ක්‍රමය බාටර් ක්‍රමය ලෙස හඳුන්වයි.
(ආ) [illegible] පෙළද ව්‍යාපාරයක් භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාර වලට අයත්වේ.
(ඇ) නිෂ්පාදනය සඳහා අවශ්‍ය භූමිය, ශ්‍රමය හා ප්‍රාග්ධනය සංවිධානය කිරීමේ ක්‍රියාවලිය ව්‍යවසායකත්වයයි.
(ඊ) රැකියා අවස්ථා උත්පාදනය කිරීම අයිතිකරුවන්ගේ අරමුණකි. (ල.02)

iii. දිනිත් කෘෂිකර්මය පිළිබඳ උපාධියක් ලබා ඇති තරුණයෙකි. ඔහු විසින් කාබනික පොහොර අලෙවිසැලක් ආරම්භ කරන ලදි. ව්‍යාපාරයට අවශ්‍ය තමන් සතු ගොඩනැගිල්ලක් ඔහු මෙම ව්‍යාපාරය සඳහා භාවිතා කරන ලදි. එය ''දිනිත් ෆුඩ්'' ලෙස නම් කරන ලදි.

(අ) '' දිනිත් ෆුඩ්'' ව්‍යාපාරයේ ශක්තියක් සඳහන් කරන්න.
(ආ) ගොඩනැගිල්ල අයත්වන නිෂ්පාදන සාධකය කුමක්ද? (ල.02)

iv. ඇල්මැති පාර්ශවයක් ලෙස සේවකයන් ව්‍යාපාරයට ලබාදෙන දායකත්වය සඳහා නිදසුන් දෙකක් ඉදිරිපත් කරන්න. (ල.02) (මුළු ලකුණු 08)

03) i. (අ) බාහිර පරිසරය යන්න කෙටියෙන් හඳුන්වන්න.
(ආ) බාහිර පරිසරයට අයත් පාර්ශව දෙකක් නම් කරන්න. (ල.02)

ii. පහත සඳහන් ප්‍රකාශ සත්‍යද අසත්‍යද යන්න ප්‍රකාශ කරන්න.
(අ) ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසරය ව්‍යාපාරයට පාලනය කළ හැකිය.
(ආ) දැඩි තරගකාරීත්වයකට මුහුණදීමට සිදුවීම ගෝලීය පරිසරයෙන් ව්‍යාපාරයට සිදුවන හිතකර බලපෑමකි.
(ඉ) ව්‍යාපාරයක් ගිණුම් සටහන් තැබීම සඳහා භාවිතා කරන පරිගණක හා තොරතුරු පද්ධති නෛතික පරිසරයට අයත්වේ.

(ඊ) රජය ව්‍යාපාර වලට බදු සහන ලබාදීම ව්‍යාපාරයකට අවස්ථාවකි. (ල.02)

iii. කොළඹවරාය නගරය සඳහා යටිතල පහසුකම් සංවර්ධන ප්‍රතිපත්ති මෙහෙයවීම රාජ්‍ය මූලික කරගත් කටයුත්තක් වේ.
ඉහත ප්‍රකාශනයෙන් දැක්වෙන ව්‍යාපාර පරිසරය කුමක්ද? (ල.02)

iv. (අ) පාරිභෝගිකයා ආරක්ෂා කිරීම සඳහා රජය විසින් පනවා ඇති අණපනත් දෙකක් ලියන්න.
(ආ) ඉහත නීතිරීති ක්‍රියාත්මක කිරීම සඳහා පිහිටුවා ඇති ආයතනයක් සඳහන් කරන්න. (ල.02) (මුළු ල.08)

04) i. චේතන විසින් විසිතුරු පැළ තවාන් කර අලෙවිකිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන අතර, '' චේතන පැළ තවාන'' යැයි නම් සඳහන් නාම පුවරුවක් එම ස්ථානයේ ප්‍රදර්ශනය කර තිබිණි.

(අ) ඔහුගේ ව්‍යාපාරය අයිතිය අනුව කුමන ව්‍යාපාර සංවිධානයකට අයත්වේද?
(ආ) එම ව්‍යාපාර සංවිධාන වර්ගයේ වාසි දෙකක් සඳහන් කරන්න. (ල.02)

ii. පහත සඳහන් ප්‍රකාශ සත්‍යද අසත්‍යද යන්න දක්වන්න.
(අ) රාජ්‍ය දෙපාර්තමේන්තු මුළු මනින්ම රජයේ සෘජු පාලනයට යටත්වේ.
(ආ) පොල් සංවර්ධන අධිකාරිය රජයේ සංස්ථාවකි.
(ඉ) ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් දක්නට ලැබීම සමුපකාර ව්‍යාපාර වල ලක්ෂණයකි.
(ඊ) ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO) සමිති ව්‍යාපාර වලට අයත් නොවේ. (ල.02)

iii. පහත සඳහන් ව්‍යාපාර සඳහා බලපැවැත්වෙන පනත් නම් කරන්න.
(අ) සංස්ථාපිත සමාගම් (ආ) සමුපකාර සමිති (ල.02)

iv. තනිපුද්ගල ව්‍යාපාර වල හා හවුල් ව්‍යාපාර වල දැකිය හැකි
(අ) සමානකම් දෙකක් දක්වන්න. (ආ) අසමානකම් දෙකක් දක්වන්න. (ල.02) (මු.ල.08)

## II කොටස (ගිණුම්කරණය)

• ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.

05) i. (අ) වගකීමක් හඳුනාගැනීමට භාවිතා කරන ලක්ෂණ දෙකක් ලියන්න. (ල.02)
(ආ) වගකීම් ප්‍රධාන වර්ග දෙකකට වර්ග කරන්න.
ii. සහන්ගේ ව්‍යාපාරය 2023 ජනවාරි මුල් සතිය තුළ සිදුවූ ගණුදෙනු පහත දැක්වේ.

2023.01.01 දිනට පැවති ශේෂ,

| | |
|---|---|
| වත්කම් ලීබඩු | රු. 45 000 |
| තොගය | රු. 120 000 |
| ණයගැතියෝ | රු. 40 000 |
| මුදල් | රු. 300 000 |
| හිමිකම (ප්‍රාග්ධනය) | රු. 330 000 |
| බැංකු ණය | රු. ? |
| ණය හිමියෝ | රු. 95 000 |

ජනවාරි 02 අමතර ප්‍රාග්ධනය ලෙස රු. 50 000ක් සහන් ව්‍යාපාරයට යෙදවීම.
ජනවාරි 03 ණයහිමියන්ට රු. 60 000ක් මුදලින් ගෙවීම.
ජනවාරි 04 රු. 100 000ක් පිරිවැය වූ භාණ්ඩ රු. 150 000ක මුදලට විකිණීම.
ජනවාරි 05 රු. 5 000ක ලිබඩු උපකරණ මිලට ගැනීම.
ජනවාරි 06 ණය පොලිය රු. 3000ක් ඇතුළත්ව රු. 30 000ක් ණය වාරිකයක් ගෙවීම.
ජනවාරි 07 අයිතිකරු රු. 2500ක් පිරිවැය වූ භාණ්ඩ තොගයක් පෞද්ගලික පරිහරණයට ගැනීම.
ඉහත ගණුදෙනු ගිණුම්කරණ සමීකරණයේ ඇතුළත් කරන්න. ඒ සඳහා පහත ආකෘතිය භාවිතා කරන්න.

| දිනය | වත්කම් | | | | = | හිමිකම් (රු) + වගකීම් (රු) | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ලී බඩු (රු) | තොගය(රු) | ණයගැතියෝ(රු) | මුදල(රු) | | (ප්‍රාග්ධනය) | බැංකු ණය | ණයහිමියෝ |
| ආරම්භක ශේෂය | | | | | | | | |
| ජනවාරි 2 | | | | | | | | |
| ජනවාරි 3 | | | | | | | | |
| ........................ | | | | | | | | |
| ........................ | | | | | | | | |
| ........................ | | | | | | | | |
| ........................ | | | | | | | | |

(ල. 6)

iii. ගණුදෙනු අවසානයේ සහන්ගේ ව්‍යාපාරයේ
(අ) හිමිකම කීයද?
(ආ) වගකීම්වල අගය කොපමණද? (ල.2)
iv. (අ) ගණුදෙනුව අවසානයේ ජංගම නොවන වත්කම් වල වටිනාකම කීයද? (මු.ල. 12)
(ආ) ජංගම වත්කම්වල අගය සොයන්න. (ල. 2)

06) i. (අ) මූලාශ්‍ර ලේඛණයක් යනු කුමක්ද?
(ආ) මූලාශ්‍ර ලේඛණ වල ප්‍රයෝජන දෙකක් ලියන්න. (ල. 2) සාරලංකා ආයතනයේ
ii. (අ) නිලංකාගේ ව්‍යාපාරයේ 2022 ඔක්තෝම්බර් මස ණයගැතියෙකු වූ
ණයපියවීමේදී රු. 7650ක වට්ටමක දෙන ලදි. මෙම වට්ටම ගිණුම්ගත කිරීමට අවශ්‍ය ජ'නල් සටහන සංලක්ෂය වටිනාකම සමග ලියන්න. (ල. 2)
(ආ) නිලංකාගේ ව්‍යාපාරය ඔක්තෝම්බර් මස ණය හිමියෙකු වූ චන්නට මුදල් ගෙවීමේදී රු.9450ක වට්ටම් ලැබිණි. මෙම වට්ටම් ගිණුම්ගත කිරීමට අවශ්‍ය ජ'නල් සටහන වටිනාකම හා සංලක්ෂය සමග පෙන්වන්න. (ල. 2)
iii. (අ) පොදු ජ'නලය යන්න හඳුන්වන්න. (ල. 1)
(ආ) පොදු ජ'නලයේ සටහන් කරනු ලබන ගණුදෙනුවකට නිදසුනක් ලියන්න. (ල. 1)

ජ'නලය පහත දැක්වේ.

| විකුණුම් ජ'නලය | | | |
|---|---|---|---|
| දිනය | ඉන්වොයිස් අංකය | විස්තරය | වටිනාකම රු. |
| 2022.10.15 | A 420 | රංගන | 7500 |
| 2022.10.15 | A 421 | නිර්මාල් | 4300 |
| 2022.10.30 | A 422 | රශිඩ | 8000 |
| 2022.10.31 | | විකුණුම් ගිණුමට මාරුකලා | 19800 |

ඔබ විසින් " සරසි ව්‍යාපාරයේ ඉහත තොරතුරු වලට අදාල විකුණුම් ගිණුම ඇතුළුව සියලුම ලෙජර් ගිණුම් පිළියෙල කරන්න. (ල.2)

(ආ) "රිවි තරණ"ව්‍යාපාරයේ නොවැම්බර් මාසය සඳහා ණයට ගැනුම් වලට අදාලව ලෙජර් ගිණුම් පහත දැක්වේ.

කවින්ද

| | | | | දිනය | විස්තරය | වටිනාකම |
|---|---|---|---|---|---|---|
| | | | | 11/20 | ගැනුම් | 47 000 |

නලින්ද

| | | | | දිනය | විස්තරය | වටිනාකම |
|---|---|---|---|---|---|---|
| | | | | 11/12 | ගැනුම් | 23 600 |

මලින්ද

| | | | | දිනය | විස්තරය | වටිනාකම |
|---|---|---|---|---|---|---|
| | | | | 11/13 | ගැනුම් | 10 500 |

ගැනුම් ගිණුම

| දිනය | විස්තරය | | වටිනාකම | | | |
|---|---|---|---|---|---|---|
| 11/12 | ණය හිමියෝ | | 81 100 | | | |

ඔබ විසින් "රිවි තරණ ව්‍යාපාරයේ නොවැම්බර් මාසය සඳහා ගැනුම් ජ'නලය පිළියෙල කරන්න. (ල.2)

(මු.ල. 12)

07) i. (අ) මුදල් වට්ටම් හා වෙළඳ වට්ටම් අතර ඔබ දකින වෙනස්කම් දෙකක් ලියන්න. (ල.1)

ii. (ආ) බැංකු සැසඳුම් පිළියෙල කිරීමේදී සංශෝධිත බැංකු ගිණුමක ඇතුළත් කරන ගණුදෙනු සඳහා උදාහරණ දෙකක් ලියන්න. (ල. 1)

iii. ඩිලානිගේ ව්‍යාපාරයේ 2022 දෙසැම්බර් මාසය අවසානයේ බැංකු ගිණුමේ වාසිදායක ශේෂය රු. 65 000ක් බැංකු විස්තරයේ ශේෂය පැවතියේ වෙනත් අගයකිනි. වෙනසට හේතු පහත පරිදි අනාවරණය විය.

1. ස්ථාවර නියෝග මත බැංකුව ගෙවා ඇති රක්‍ෂණ වාරිකය රු. 5000කි.
2. බැංකුව වෙත ලැබී ඇති සෘජු ප්‍රේෂණ (ආයෝජන ආදායම) රු. 6200කි.
3. තැන්පත් කළ නමුත් බැර නොවූ චෙක්පත් රු. 11400කි.
4. බැංකුව විසින් අයකරගෙන ඇති බැංකු ගාස්තුව රු. 3000කි.
5. බැංකුව වෙත ඉදිරිපත් නොවූ චෙක්පත් රු. 7900කි.

අවශ්‍ය වන්නේ,

(අ) සංශෝධිත බැංකු ගිණුම (ල.2)

(ආ) 2022 දෙසැම්බර් මාසය සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශය (ල.2)

iv. අශෝකගේ ව්‍යාපාරයේ 2022.12.31 දිනට පිළියෙල කරන ලද ශේෂ පිරික්සුම තුලනය නොවූ බැවින් වෙනස අවිනිශ්චිත ගිණුමක සටහන් කරන ලදි. පසුව ගිණුම් පරීක්‍ෂා කිරීමේදී පහත වැරදි අනාවරණය විය.

1. විදුලිය ගාස්තු ලෙස ගෙවූ රු.3500ක මුදල මුදල් පොතේ පමණක් සටහන් කර ඇත.
2. රක්‍ෂිත ගාස්තු ගිණුමේ රු. 5750ක ශේෂය ශේෂ පිරික්සුමට ගෙන ඇත.
3. ණය හිමියෙකුට ගෙවන ලද රු.8000ක මුදල ගිණුම්වල දෙවරක් සටහන්වී ඇත.
4. ලැබූ ගෙවල්කුලී 10,000 ලැබූ ගෙවල් කුලී ගිණුමේ සටහන් කර ඇත්තේ රු. 1000ක් ලෙසිනි.

අවශ්‍ය වන්නේ,

(අ) වැරදි නිවැරදි කිරීමට අදාල ජ'නල් සටහන් (සංලක්‍ෂය සමග) (ල. 4)

(ආ) වැරදි නිවැරදි කිරීමට පෙර අවිනිශ්චිත ගිණුමේ ශේෂය (ල. 02) (මුළු ලකුණු 12)